# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2255/15 – 2021 නොවැම්බර් 24 වැනි බදාදා – 2021.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**හෝටල් හා භෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට හෝටල් හා භෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥා පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දැක්වෙන විරෝධතාවයන් 2021 දෙසැම්බර් මස 08 දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
සභාපති,
හෝටල් හා භෝජන සැපයීමේ කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2021 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියස'',
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

1A – G 35412 – 15 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

හෝටල් හා භෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1979 අප්‍රේල් මස 27 වැනි දින අංක 34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2018 ජූලි මස 26 වන දින අංක 2081/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ ද, තීරණ පහත සඳහන් පරිදි තවදුරටත් වෙනස් කළ යුතුය.

හෝටල් හා භෝජන සැපයීමේ කර්මාන්තයෙහි නියුක්ත I වන කොටසේ සඳහන් විවිධ ශ්‍රේණි යටතේ දැක්වෙන කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II වන කොටස එම ශ්‍රේණියට අනුරූප සටහනෙහි දැක්වෙන ප්‍රමාණය විය යුතුය.

## I කොටස

**සේවකයන්ගේ පන්තිය**

*I වන ශ්‍රේණිය*

ඇසිස්ටන් රූම්බෝයි, ක්ලෝක් රූම් ඇටෙන්ඩන්ට්, ක්ලෝක් රූම් නැනී, කම්කරු - නිදන කාමර ක්ලීනර්ස්, විවේකාගාර කම්කරුවෝ, නිදන කාමර කසල ශෝධකයෝ, කසල ශෝධක කම්කරු, ඔෆිස් බෝයි, කාර්යාල කම්කරු, කම්කරු ගබඩා, සයිකල් ඕඩර්ලි, මුළුතැන්ගෙයි පිරිසිදුකරන්නා, මුළුතැන්ගෙයි සහායක, පිඟන් සෝදන්නා, කම්කරු මුළුතැන්ගෙයි, පෝටර්, පැන්ට්‍රි බෝයි, උදව්කරු, ප්ලේට් රූම් බෝයි, ග්ලාස් රූම් බෝයි, සිල්වර් රූම් බෝයි, බාර් ලේබර්ස්, යුටිලිටි වර්කර්ස්, වතු කම්කරු/උදව්කරු, නුපුහුණු කම්කරු (නඩත්තු)

*II වන ශ්‍රේණිය*

රූම්බෝයි, හවුස්මන්, රූම්මේඩ්, ලිනන් රූම් ඇටෙන්ඩන්ට්, රූම් නැනී, පියන්වරුන්, මැසෙන්ජර්, චෙකර්වරු, බෙල්බෝයි, පේජ්බෝයි, සෝපානකරු, දොරටුපාලකවරුන්, බැගේජ් ලිෆ්ට් ඔපරේටර්වරු, පාස් ලිෆ්ට් ඔපරේටර්වරු, සහකාර වේටර්, සහකාර ස්ටුවඩ්, බස් බෝයි, බාර් ටෙන්ඩර් සහකරු, සහකාර බාර්මන්, බිලියඩ් මාකර්, ලයිෆ් ගාර්ඩ්, ලොන්ඩ්‍රි ඇසිස්ටන්ට්, ගාඩිනර්, පූල් ඇටෙන්ඩන්ට්, අර්ධ පුහුණු කම්කරු (නඩත්තු).

*III වන ශ්‍රේණිය*

සීම්ස්ට්‍රස් ටේලර්ස්, සම්බාහකයෝ, ලිපිකරු III වන ශ්‍රේණිය, ගබඩා සහායක, රියදුරුවරු, බාර් කැෂියර්වරු, බිල් ලිපිකරු, සාමාන්‍ය ලිපිකරු, පෞද්ගලික ලිපිකරු, ස්නැක් බාර් අරක්කැමි, රසකැවිලි සාදන්නෝ, සහකාර අරක්කැමි, තර්ඩ් කිචන් කොමිස්, සහකාර බක්කරේ, පැන්ට්‍රිමන්, අරක්කැමි III වන ශ්‍රේණිය, ඇසිස්ටන් බෙල් කැප්ටන්, හෝල් පෝටර්, වේටර්, බාර්මන්, ස්ටුවර්ඩ්, බාර් වේටර්, බාර් ස්ටුවර්ඩ්, සිකියුරිටි ගාර්ඩ්, උද්‍යාන පාලක, පුහුණු කම්කරු (නඩත්තු), බාර්ටෙන්ඩර්.

*IV වන ශ්‍රේණිය*

හෙල්ත් ක්ලබ් පිළිගැනීමේ නිලධාරී, ලිපිකරු II වන ශ්‍රේණිය, සහකාර ගබඩාකරු, ගබඩා ලිපිකරු, ඇසිස්ටන් නයිට් ඕඩිටර්, ටයිම් කීපර්, කාර්ඩෙස් ඇසිස්ටන්වරු, ගිණුම් ලිපිකරු, සහකාර පොත් තබන්නා, කොස්ට් ක්ලාක්, ක්‍රෙඩිට් ක්ලාක්, විකුණුම් ලෙජර් ලිපිකරු, වැටුප් ලිපිකරු, යතුරු ලියන්නා, මුදල් අයකැමි, ජෙනරල් ඇසිස්ටන්, පෞද්ගලික සහකාර, සහකාර ප්‍රධාන අරක්කැමි, සෙකන්ඩ් කිචන් කොමිස්, බක්කරේ, අංශ ප්‍රධාන අරක්කැමි, II වන පන්තියේ අරක්කැමි, දුරකතන ක්‍රියාකරු, පිළිගැනීම් නිලධාරී, බෙල් කැප්ටන්, ප්‍රධාන පෝටර්, රූම් සර්විස් ඕඩර් ටේකර්, බට්ලර්වරු, හෙඩ් බාර්මන්, හෙඩ් බාර් කීපර්, හෙඩ් වේටර්, හෙඩ් ස්ටුවර්ඩ්, කැප්ටන් හොස්ටෙස්, හෙඩ් පැන්ට්‍රිමන්, ටී මේකර්, සිකියුරිටි ලීඩර්, සීනියර් ලොන්ඩ්‍රි ඇසිස්ටන්ට්.

*V වන ශ්‍රේණිය*

ෆ්ලෝ සුපර්වයිසර්වරු, ලිනන් රූම් සුපවයිසර්වරු, හෙදි, ඇසිස්ටන් හවුස් කීපර්, ලිපිකරු I වන ශ්‍රේණිය, ගබඩාභාරකරු, ප්‍රධාන ගිණුම් ලිපිකරු, සරප්, පොත් තබන්නා, නයිට් ඔඩිටර්, ආදායම් ගණන් පරීක්ෂක, ලඝු ලේඛක, ප්‍රධාන ලිපිකරු, ප්‍රධාන අයකැමි, ගණන් පරීක්ෂක, සහකාර මිලදී ගැනීමේ නිලධාරී, චීෆ් ටයිම් කීපර්, කිචන් ස්ටුවර්ඩ් සුපර්වයිසර්, ෆස්ට් කිචන් ස්ටුවර්ඩ් සුපර්වයිසර්, ෆස්ට් කිචන් කොමිස්, ප්‍රධාන අරක්කැමි, මණ්ඩලයීය අරක්කැමි, රෙස්ටුරන්ට් අරක්කැමි, ෆ්‍රන්ට් ඔෆිස් ක්ලාක්, ගුවන්තොටුපල නියෝජිත, ප්‍රධාන පිළිගැනීමේ නිලධාරී, ප්‍රධාන ටෙලෙක්ස් ක්‍රියාකරු, ප්‍රධාන දුරකතන ක්‍රියාකරු, රිසවේෂන් ක්ලාක්, පරිපාලක, ඩිස්කෝතේ කළමනාකරු, සෙකියුරිටි ෂිෆ්ට් ලීඩර්, උද්‍යාන පරිපාලක, ඉංජිනේරු වාජ්හැන්ඩ්, පිහිනුම් තටාක පරිපාලක.

II කොටස

**වැඩකරන මාසයක් සඳහා වූ අවම වේතන ප්‍රමාණ**

| සේවක පන්තිය | | | | | |
|---|---|---|---|---|---|
| *සේවා වසර* | *ශ්‍රේණිය I රු. ශත* | *ශ්‍රේණිය II රු. ශත* | *ශ්‍රේණිය III රු. ශත* | *ශ්‍රේණිය IV රු. ශත* | *ශ්‍රේණිය V රු. ශත* |
| 1 වසර | 12.500.00 | 13,025.00 | 13,550.00 | 14,075.00 | 14,600.00 |
| 2 වසර | 12,600.00 | 13,150.00 | 13,700.00 | 14,250.00 | 14,800.00 |
| 3 වසර | 12, 700.00 | 13,275.00 | 13,850.00 | 14,425.00 | 15,000.00 |
| 4 වසර | 12,800.00 | 13,400.00 | 14,000.00 | 14,600.00 | 15,200.00 |
| 5 වසර | 12,900.00 | 13,525.00 | 14,150.00 | 14,775.00 | 15,400.00 |
| 6 වසර | 13,000.00 | 13,650.00 | 14,300.00 | 14,950.00 | 15,600.00 |
| 7 වසර | 13,100.00 | 13,775.00 | 14,450.00 | 15,125.00 | 15,800.00 |
| 8 වසර | 13,200.00 | 13,900.00 | 14,600.00 | 15,300.00 | 16,000.00 |
| 9 වසර | 13,300.00 | 14,025.00 | 14,750.00 | 15,475.00 | 16,200.00 |
| 10 වසර | 13,400.00 | 14,150.00 | 14,900.00 | 15,650.00 | 16,400.00 |

12 - 102/1

---

## පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

**ගඩොල් සහ උළු නිපදවීමේ කාර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥා පනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිත සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥා පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2021 දෙසැම්බර් මස 08 දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක් ම එසේ විරුද්ධ වීමට හේතුවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
**සභාපති,**
ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2021 නොවැම්බර් මස 24 වැනි දින.
මෙහෙවර පියෙස,
කොළඹ 05.
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව වර්ෂ 1961 අගෝස්තු මස 25 වැනි දින අංක 12617 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද , අවසන් වරට 2019 ජනවාරි මස 30 වැනි දින අංක 2108/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ ද තීරණ, එම උපලේඛනයෙහි **II** වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

## II වැනි කොටස

ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තයේ නියුක්ත සේවක පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය සහ අවම මාසික වේතන ප්‍රමාණය පහතින් දක්වා ඇත.

**සේවකයින්ගේ පන්තිය**

*පුහුණු කම්කරුවෝ I වැනි ශ්‍රේණිය:*

ප්‍රෙස් යන්ත්‍රයට මැටි සපයන්නෝ (යන්ත්‍රයෙන්), පොරණුවලට ගින්දර දමන්නෝ (දාහකයෙන්)

*පුහුණු කම්කරුවෝ II වැනි ශ්‍රේණිය:*

ප්‍රෙස් යන්ත්‍රයට මැටි සපයන්නෝ (අතින්) පිළිස්සීම සඳහා පෝරණුව තුළ උළු පැටවීමේ සහ කඳු ගැසීමේ යෙදෙන්නෝ, තෝරා වෙන්කරන්නෝ.

*අර්ධ පුහුණු කම්කරුවෝ:*

දබර කරකවන්නෝ, කට්ටි කපන්නෝ, උළු කට්ටවලට තෙල් ගාන්නෝ සහ මට්ටම් කරන්නෝ, සාහින්නෝ, අමු උළු තෝරා වෙන් කරන්නෝ, ගෙනයාම සඳහා උළු වාහනවලට ගොඩ ගසන්නෝ.

*නුපුහුණු කම්කරුවෝ:*

මැටි කලවම් කිරීමේ සහ පෑහීමේ යෙදී සිටින කම්කරුවෝ, ට්‍රක් පුරවන්නෝ, මැටි කරුවෝ, කට්ටි ගෙනයන්නෝ, යන්ත්‍රයෙන් මිශ්‍ර කිරීමේදී හා අත් ගැසීමේ යෙදී සිටින කම්කරුවෝ, රාක්කවලට උළු ගොඩගැසීමේ යෙදී සිටින කම්කරුවෝ, උළු හිරු රැසින් වේලීමේ යෙදී සිටින කම්කරුවෝ, උළු තෝරා වෙන්කරන්නන්ගේ අත් උදව්කරුවෝ, අමු උළු තෝරා වෙන්කරන්නන්ගේ අත් උදව්කරුවෝ, දර අදින්නෝ, අත් ගසන යන්ත්‍රයට මැටි සපයන්නෝ, උළු කඳු ගසන්නෝ, ප්‍රෙස් යන්ත්‍රවලට හෝ ගබඩාවේ අනෙක් කොටස්වලට මැටි කට්ට ගෙනයන්නෝ, පිළිස්සීම සඳහා පෝරණුව තුළ උළු පැටවීමෙහි සහ කඳු ගැසීමෙහි යෙදෙන්නන්ගේ අත් උදව්කරුවෝ.

**අවම දෛනික වේතන ප්‍රමාණය**

| *I තීරය* | *II තීරය* |
|---|---|
| *සේවකයාගේ පන්තිය* | *ප්‍රමාණය රු. ශත.* |
| පුහුණු කම්කරුවෝ I ශ්‍රේණිය | 638.00 |
| පුහුණු කම්කරුවෝ II ශ්‍රේණිය | 604.00 |
| අර්ධ පුහුණු කම්කරුවෝ | 569.00 |
| නුපුහුණු කම්කරුවෝ | 534.00 |

අවම මාසික වේතන ප්‍රමාණය

| *සේවකයාගේ පන්තිය* | *1 වසර* | *2 වසර* | *3 වසර* | *4 වසර* | *5 වසර* |
|---|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| පුහුණු කම්කරුවෝ I ශ්‍රේණිය | 15, 962.00 | 16,137.00 | 16,312.00 | 16,487.00 | 16,662.00 |
| පුහුණු කම්කරුවෝ II ශ්‍රේණිය | 15,094.00 | 15,244.00 | 15,394.00 | 15,544.00 | 15,694.00 |
| අර්ධ පුහුණු කම්කරුවෝ | 14,222.00 | 14,347.00 | 14,472.00 | 14,597.00 | 14,722.00 |
| නුපුහුණු කම්කරුවෝ | 13,351.00 | 13,451.00 | 13,551.00 | 13,651.00 | 13,751.00 |

12 – 102/2

---

## පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

### රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2021 දෙසැම්බර් මස 08 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
සභාපති,
රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා
පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2021 නොවැම්බර් මස 24 වැනි දින,
"මෙහෙවර පියෙස",
කොළඹ 05.
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් 1968 දෙසැම්බර් මස 06 වැනි දින අංක 14831 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කල වෙනස් කරන ලද්දාවූද සහ අවසන් වරට 2018 ජූලි මස 16 වැනි දින අංක 2080/20 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ වෙනස් කරන ලද්දා වූ තීරණයන් එම උපලේඛනයේ II වන කොටසේ මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය යන ශීර්ෂය යටතේ දැක්වෙන කොටස වෙනුවට පහත සඳහන් ආදේශය කිරීමෙන් තවදුරටත් වෙනස් කරනු ලැබේ.

II වන කොටස

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වසර | නුපුහුණු | අඩ පුහුණු | පුහුණු | වෘත්තීය පුහුණු හදාරන්නන් ආධුනිකයන් |
|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 1 වසර | 12,500.00 | 13,006.25 | 13,512.50 | 8,750.00 |
| 2 වසර | 12,600.00 | 13,131.25 | 13,662.50 | 8,950.00 |
| 3 වසර | 12,700.00 | 13,256.25 | 13,812.50 | 9,150.00 |
| 4 වසර | 12,800.00 | 13,381.25 | 13,962.50 | 9,350.00 |
| 5 වසර | 12,900.00 | 13,506.25 | 14,112.50 | |
| 6 වසර | 13,000.00 | 13,631.25 | 14,262.50 | |
| 7 වසර | 13,100.00 | 13,756.25 | 14,412.50 | |
| 8 වසර | 13,200.00 | 13,881.25 | 14,562.50 | |
| 9 වසර | 13,300.00 | 14,006.25 | 14,712.50 | |
| 10 වසර | 13,400.00 | 14,131.25 | 14,862.50 | |
| 11 වසර | 13,500.00 | 14,256.25 | 15,012.50 | |
| 12 වසර | 13,600.00 | 14,381.25 | 15,162.50 | |
| 13 වසර | 13,700.00 | 14,506.25 | 15,312.50 | |
| 14 වසර | 13,800.00 | 14,631.25 | 15,462.50 | |
| 15 වසර | 13,900.00 | 14,756.25 | 15,612.50 | |
| 16 වසර | 14,000.00 | 14,881.25 | 15,762.50 | |
| 17 වසර | 14,100.00 | 15,006.25 | 15,912.50 | |
| 18 වසර | 14,200.00 | 15,131.25 | 16,062.50 | |
| 19 වසර | 14,300.00 | 15,256.25 | 16,212.50 | |
| 20 වසර | 14,400.00 | 15,381.25 | 16,362.50 | |
| 21 වසර | 14,500.00 | 15,506.25 | 16,512.50 | |
| 22 වසර | 14,600.00 | 15,631.25 | 16,662.50 | |
| 23 වසර | 14,700.00 | 15,756.25 | 16,812.50 | |
| 24 වසර | 14,800.00 | 15,881.25 | 16,962.50 | |
| 25 වසර | 14,900.00 | 16,006.25 | 17,112.50 | |

12 – 102/3

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

### පොල් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, පොල් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ

පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දක්වන විරෝධතාවයන් 2021 දෙසැම්බර් මස 08 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ඊට අඩංගු විය යුතුය.

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
සභාපති,
පොල් නිපදවීමේ කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2021 නොවැම්බර් මස 24 වැනි දින,
"මෙහෙවර පියෙස",
කොළඹ 05.
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

පොල් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1949 අප්‍රේල් මස 30 වැනි දින අංක 9971 දරන *ගැසට්* පත්‍රයෙහි පළවූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2019 ජනවාරි මස 30 වැනි දින අංක 2108/35 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළවූ නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයෙහි II හා III වන කොටස් වෙනුවට පහත සඳහන් කොටස් ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතුය.

### II වන කොටස

ආඥාපනතේ 06 වන වගන්තිය යටතේ වූ නිවේදනයේ විස්තර කළ පොල් නිපදවීමේ කර්මාන්තයේ කටයුතුවල ඇතැම් කාර්යයන් සම්බන්ධයෙන් කෑලි මිම්මේ වැඩ සඳහා වලංගු වූ අවම වේතන ප්‍රමාණයන් මෙසේය.

| *කාර්යය*<br>*වේලාපු පොල් නිපදවීමේදී* | *ප්‍රමාණය* | *රු. ශත* |
|---|---|---|
| පොල් ලෙලි ගැසීම | ගෙඩි 1000 | 541.00 |
| කටු ගැලවීම | ගෙඩි 1000 | 375.00 |
| කුරුටු ගෑම | ගෙඩි 1000 | 375.00 |
| පොල් මද සේදීම හා කඩ කිරීම | රාත්තල් 1000 | 327.00 |
| වේලීම (ඩ්‍රයරයෙන්) | රාත්තල් 1000 | 256.00 |
| වේලීම (ඩෙසිකේටරයෙන්) | රාත්තල් 1000 | 345.00 |
| හැලීම සහ ශ්‍රේණි කිරීම | රාත්තල් 1000 | 290.00 |
| ඇහිරීම සහ තහඩු අකුරු ගැසීම | රාත්තල් 120-130 බෑගයක් | 23.00 |

ගම්බද කර්මාන්තයක් වශයෙන් හැරෙන්නට කෙඳි සහ කොහු නිෂ්පාදන තැනීමේ දී:

| | | *රු. ශත* |
|---|---|---|
| ලෙලි තැලීම (ඇට කෙඳි කොහු) තෙත පිටින් බර | හොන්ඩරයකට | 236.00 |
| ලෙලි කැඩීම හා (ශුද්ධ කිරීම) තෙත පිටින් බර | හොන්ඩරයකට | 236.00 |

| | | රු. ශත |
|---|---|---|
| ගුදිරි කොහු ශුද්ධ කිරීම, වේලීම සහ මිටි බැඳීම | හොන්ඩරයකට | 202.00 |
| ඇට කෙඳි කොහු කැරලි සහ බැඳීම | හොන්ඩරයකට | 192.00 |
| පැදුරු සහ කළාල තැනීම | | |
| පැදුරු වර්ග | අඩියකට | 232.00 |
| කළාල වර්ග | යාරයකට | 211.00 |
| ඇට කෙඳි කොහු පිරීම සහ බැඳීම | හොන්ඩරයකට | 628.00 |

## III වන කොටස

**කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණයන්**

මෙහි I වන තීරයෙහි නිශ්චිතව සඳහන් කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා සාමාන්‍ය වැඩ කරන දිනයකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය II වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති ප්‍රමාණයෙන් විය යුතුය.

| | *I වන තීරය*<br>*සේවකයාගේ පන්තිය* | *II වන තීරය*<br>*ප්‍රමාණය*<br>රු. ශත |
|---|---|---|
| කපාපු පොල් නිෂ්පාදනය | කංකානමට | 595.00 |
| පොල්තෙල් නිෂ්පාදනය | කම්කරුවෙකුට (ස්ත්‍රී/පුරුෂ) | 574.00 |
| කොහු හා කොහු නිෂ්පාදන | කම්කරුවෙකුට (ස්ත්‍රී/පුරුෂ) | 500.00 |
| කොහු හා කොහු නිෂ්පාදන | කංකානමට | 500.00 |

12 - 102/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.